අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023**

1.0 2012.02.16 දිනැති PSE/EST/3/1/17/2012 මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද බඳවාගැනීමේ පටිපාටියේ 08 වන ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ අධිකරණමය නොවන නිලධාරින් පුහුණු කිරීමේ ආයතනය මගින් 2023 මාර්තු මාසයේදී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් - මෙතක් යථෝක්ත විභාගය සම්පූර්ණ නොකළ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක II ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධාරියකු වීම.

3.0 අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2023 මාර්තු 20 දින හෝ ඊට පෙර ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො. 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

4.0 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණමය නොවන නිලධාරින් පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විනය බලධාරියා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

5.0 (I) **අයදුම්පත්** - ආදර්ශ අයදුම්පතේ අංක 1.0 සිට 7.0 තෙක් ඡේද පළමුවන පිටුවටද ඉතිරිය අනෙක් පිටුවටද ඇතුළත් වන පරිදි *ඒ4* ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත පිළියෙල කළ යුතුය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කළ යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපතක් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(II) **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්** - අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(III) පළමුවරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. මීට පෙර විභාගයට අයදුම් කර ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලදුව විභාගයට පෙනී නොසිටියද එය විභාගයට පෙනී සිටි වාරයක් ලෙස සැලකිය යුතුය. දෙවන සහ ඉන්පසු වාර සඳහා අයදුම් කරන නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500 ක මුදලක් ද එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 250 ක මුදලක් ද විභාග ගාස්තු වශයෙන් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන 176-1-001-9-9025184 දරන ගිණුමට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

6.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ අයතනය විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ අයතනය විසින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 5ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත හා ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය,ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් නිලධාරීන් අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ අයතනය වෙතින් විමසිය යුතුය

**සටහන:** *අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රය නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.*

7.0 අයදුම්පතේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියාගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

8.0 විභාගය සඳහා පෙනී සිටින අවස්ථාවේදී විභාග ශාලාධිපති වෙත ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

9.0 අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ලැබූ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 විභාගය සිංහල හා දෙමළ යන භාෂාවලින් පැවැත්වේ. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11.0 මෙම විභාගය සමත්වීම සඳහා විෂයට නියමිත මුලු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ක් ලබාගත යුතුවේ.

12.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය මගින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. එම ප්‍රතිඵල අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

13.0 **විභාග පටිපාටිය -**

| විෂය අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | ප්‍රශ්න පත්‍රයේ කාලය | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 01. | සමාජ ඒකාබද්ධතාවය | පැය 01 | - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සමාජ ඒකාබද්ධතාව ආරක්ෂාව කිරීමට ඇති ප්‍රතිපාදන<br>- ඒකීය හා සන්ධීය පාලන ක්‍රම<br>- සමාජ ඒකාබද්ධතාවය ආරක්ෂා කොට වර්ධනය කිරීමට විවිධ රාජ්‍යය විසින් (උදා: දකුණු අප්‍රිකාව, ස්විස්ටර්ලන්තය, ඉන්දියාව, සිංගප්පූරුව, කැනඩාව) විසින් ගෙන ඇති පියවර<br>- සමාජ ඒකාබද්ධතාවය ගොඩනැංවීම කෙරෙහි අන්තර්ජාතික සංවිධානවල දායකත්වය<br>- විවිධ රටවල පවතින වාර්ගික හා ආගමික අර්බුද |

14.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**ආර්.එස්.හපුගස්වත්ත**
අතිරේක ලේකම් (පාලන)
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට